කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2019

2023 - අප්‍රේල්

**BCOME 1055 – ව්‍යාපාර හා කාර්මික නීතිය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 08 කාලය : පැය 03 යි

අවම වශයෙන් 2 කොටසින් එක් ප්‍රශ්නයක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය.

---

**1 කොටස**

**ප්‍රශ්ණ අංක 01**

අ. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සංයුතිය සහ අධිකරණ බලතල මොනවාදැයි දක්වන්න.
(ලකුණු 10)

ආ. ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය වර්ධනය කිරීම උදෙසා දායක වූ නීති හතරක් සඳහන් කරන්න
(ලකුණු 04)

ඇ. ශ්‍රී ලංකාවේ නීති මූලාශ්‍ර ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තීරණය කරන ලද නඩු තීන්දු කෙසේ වැදගත් වේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 06)
(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 02**

අ. "සංග්‍රහ කිරීමට ආරාධනාවක් අර්පනයක් නොවේ". තීරණය කරන ලද නඩු සම්බන්ධයෙන් මෙම ප්‍රකාශයේ වලංගු භාවය සාකච්ඡා කරන්න.
(ලකුණු 10)

ආ. ජීවක කොවිඩ් 19 සඳහා බෙහෙත් පිළියෙළ කළ අතර සති දෙකක් අඛණ්ඩව දිනකට තුන් වරක් ඖෂධ භාවිතා කිරීමෙන් පසු කොවිඩ් වැළඳුණු ඕනෑම පුද්ගලයෙකුට රුපියල් 100,000 ක් ලබා දීමට තමා සූදානම් බව පුවත්පත් සහ සමාජ මාධ්‍යවල ප්‍රචාරය කරයි. ඔහු වැඩිදුරටත් පවසන්නේ තමන් මේ සඳහා ABC බැංකුව, මහරගම ශාඛාවේ රුපියල් 500,000 මුදලක් තැන්පත් කර ඇති බවයි. සුකුමාලි මහත්මිය එම දැන්වීම දුටු අතර එය මිලදී ගෙන නිෂ්පාදකයා විසින් විස්තර කර ඇති පරිදි සති දෙකක කාලයක් සඳහා භාවිතා කළාය. අවසානයේදී, ඇයට Covid 19 වැළඳුන අතර ඇය ත්‍යාගය ඉල්ලා සිටියාය. එවිට ජීවක ඇයට රුපියල් 100,000ක් ගෙවීම ප්‍රතික්ෂේප කළ අතර සුකුමාලි සහ ඔහු අතර ගිවිසුමක් නොමැති බවත් ඔවුන් එම දැන්වීම පළ කර ඇත්තේ අලෙවි ප්‍රවර්ධන අරමුණු සඳහා පමණක් බවත් ප්‍රකාශ කළේය. සුකුමාලිට මෙම ත්‍යාගය ලබාගත හැකිද ? අදාළ නඩු නීතිය වෙත අවධානය යොමු කරමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න
(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 03

අ. පෙරේරා මහතා සහ එම මහත්මිය නිවාඩුවක් ගත කිරීමට ත්‍රිකුණාමලයට ගියහ. ඔවුන් නගරයේ සිට කිලෝමීටර 1 ක් දුරින් පිහිටි බීච්සයිඩ් හෝටලයේ නවාතැන් ගැනීමට තීරණය කළහ. හෝටලයේ පිළිගැනීමේ කවුන්ටරය අසලදී ඔවුන් මුදල් ගෙවා කාමරයේ යතුර ලබා ගත්හ. ඔවුන් කාමරයට ගිය විට දුටුවේ "ආරක්ෂිතව තබා ගැනීමට කළමනාකරණය වෙත භාර නොදුන් වටිනා දේපළ නැති වීම පිළිබඳව හෝටලය වග නොකියන බවයි." සවස් කාලය ගත කිරීමට ඔවුන් මුහුදු වෙරළට ගියහ. මේ අතර ඔවුන්ගේ කාමරයට ඇතුළු වූ සොරෙකු පෙරේරා මහත්මියගේ රුපියල් 250,000ක් වටිනා රන් මාලය සොරකම් කළේය. දැන් ඇයට ඇගේ නැතිවූ ස්වර්ණාභරණ සඳහා හෝටලයෙන් වන්දියක් ලබා ගැනීමට අවශ්‍යව ඇත. තීරණය කරන ලද නඩු වල සහාය ඇතිව ඇයට හෝටලයෙන් අලාභ අයකර ගත හැකිද යන්න පිළිබඳව ඇයට උපදෙස් දෙන්න.

(ලකුණු 12)

ආ. ගිවිසුම් සෑදීම සඳහා අදාල වන අගනා ප්‍රතිෂ්ඨාවන් මොනවාදැයි නම් කර නිදසුන් සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 04

අ. ජෝන් මෝටර් රථයක් විකිණීමට ප්‍රචාරණය කළ අතර එය 2010 දී නිෂ්පාදනය කර ඇති බව සඳහන් කළේය. ඩේවිඩ් මෝටර් රථය පරීක්ෂා කිරීමට පැමිණ එය මිලදී ගැනීමට තීරණය කළේය. මෝටර් රථය මිලදී ගැනීමෙන් පසු, විස්තරයට අනුරූප වන්නේ පසුපස භාගය පමණක් බව ඩේවිඩ් සොයා ගත්තේය. අනෙක් කොටස 1995 දී නිෂ්පාදනය කරන ලද තවත් මෝටර් රථයක කොටසක් වූ ඉදිරිපස භාගයට වැල්ඩින් කර ඇත. දැන් ඩේවිඩ්ට ගිවිසුම අවලංගු කිරීමට අවශ්‍යව ඇත. තීරණය කළ නඩු ඇසුරෙන් ඩේවිඩ්ට ගිවිසුම අවලංගු කළ හැකිද යන්න සාකච්ඡා කරන්න

(ලකුණු 10)

ආ. 1896 භාණ්ඩ විකිණීමේ ආඥාපනතේ භාණ්ඩ වර්ගීකරණය යටතේ එන භාණ්ඩ වර්ග 5ක් සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

ප්‍රශ්ණ අංක 05

අ. රක්ෂණ ගිවිසුමක් සහ ආරක්ෂණ ගිවිසුමක් අතර ඇති වෙනස්කම් මොනවාද?

(ලකුණු 10)

ආ. බිංදු සහ මාරා හවුල්කරුවන් විය. සමාගමට අවශ්‍ය සීනි මිලදී ගැනීම සඳහා මාරාව පත් කරන ලදී. මාරා බිංදුගේ අනුදැනුමකින් තොරව තමාගේම සීනි වෙළඳපොළ මිලට වඩා වැඩි මිලකට සමාගමට විකුණා සැලකිය යුතු ලාභයක් ලබා ගත්තාය. මෙම තත්ත්වය තුළ හෙළිදරව් කිරීම පිළිබඳව හවුල්කරුවන්ගේ යුතුකම කුමක්දැයි දක්වා මෙම ගනුදෙනුව පිළිබඳ මාරාගේ වගකීම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 06**

අ. කිංග්ස් හෝටලයේ නියෝජිතයා වන රොබට් නුවරඑළියේ පිහිටි එම හෝටලය වෙත යැවීම සඳහා කොළඹින් විශාල යෝගට් තොගයක් මිලදී ගත්තේය. නුවරඑළියේ දිගු කලක් පැවති අධික වර්ෂාව සහ නායයෑම් නිසා රොබට්ට යෝගට් තොගය කිංග්ස් හෝටලයට යැවීමට නොහැකි විය. හෝටලය සමඟ සන්නිවේදනය නොකර, රොබට් යෝගට් සියල්ල කොළඹ දී අඩු මිලට විකුණා ඉන් අනතුරුව කිංග්ස් හෝටලයට මුදල් යැවීය. දැන් කිංග්ස් හෝටලය රොබට්ට එරෙහිව අලාභ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට අදහස් කරයි. රොබට් මේ සම්බන්ධයෙන් වගකිව යුතුදැයි තීරණය කළ නඩු සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. 2007 අංක 07 දරන සමාගම් පනතේ අඩංගු විධිවිධාන පිළිබඳව අවධානය යොමු කරමින් පහත සඳහන් දේ පිළිබඳව සටහන් ලියන්න.

i) සමාගමක් සංස්ථාගත කිරීම

ii) සාංගමික ව්‍යවස්ථාවලිය

(ලකුණු 05x2)

(මුළු ලකුණු 20)

**11 කොටස**

**ප්‍රශ්ණ අංක 07**

අ. ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකුගෙන් සේවකයෙකු වෙන්කර හඳුනා ගැනීම සඳහා අධිකරණය විසින් සකස් කරන ලද විවිධ පරීක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. පරිවාස කාලය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 04)

ඇ. "පරිවාස කාලය තුළ, සේවා යෝජකයාට හේතු දැක්වීමකින් තොරව පරිවාසකරුවෙකුගේ සේවය අවසන් කළ හැක." ඔබගේ අදහස් දක්වන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්ණ අංක 08**

අ. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙන් ආවරණය නොවන සේවකයන් වර්ග පහක් සඳහන් කරන්න

(ලකුණු 05)

ආ. පහත සඳහන් දෑ සම්බන්ධයෙන් සාප්පු සහ කාර්යාල සේවක පනතේ අඩංගු විධිවිධාන මොනවාද?

i) වැඩ කරන පැය ගණන

ii) වාර්ෂික නිවාඩු

iii) මාතෘ ප්‍රතිලාභ

(ලකුණු 3 x 3)

ඇ. 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥාපනත යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වෘත්තීය සමිතියක් භුක්ති විඳින අයිතිවාසිකම් මොනවාද?

(ලකුණු 06)

(මුළු ලකුණු 20)